# අලවතුර ගණේගොඩ පුරාණ විහාරයේ අප්‍රකට රූකම්

එල්.ඩී. මයුර ප්‍රේමරත්න*, ජේ. නුවන් රංජිත් දිසානායක**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

*rajapelapatha.prem@gmail.com, **nuwandisanayake575@gmail.com

ප්‍රමුඛ පදඃ නර්තන ශිල්පීන්, ශිලා කැටයම්, වාස්තු විද්‍යාව

## හැඳින්වීම

ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට හෝ ඊට පෙර සිට මානවයා සිය වාසස්ථානය වශයෙන් ගල්ලෙන් තෝරා ගෙන තිබේ. සිය ජීවිත පවත්වාගෙන යාම උදෙසා මෙලෙස ස්භාවික පරිසරයේ ආරක්ෂාව පැතූ මානවයා ශාක හා සත්ත්ව ගෘහාශ්‍රිතකරණයට ක්‍රමයෙන් එළඹීමත් සමඟ ඔහු සිය පරිණාමීය ජීවිතයේ පියවර ක්‍රමයෙන් ඉදිරියට තබා තිබෙන බව පැහැදිලි ය. මෙලෙස ක්‍රමිකව සංවර්ධන යුගයන් කරා පිවිසි මානවයා ඉදිකිරීම් තාක්ෂණය හා වාස්තු විද්‍යාව ආදී විෂය ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරමින් ඉදිකිරීම් සිදු කර තිබෙන බවට අතීත සාධක අධ්‍යනයේදී මනාව ගම්‍ය වේ. එහි එක් උච්චතම අවස්ථාවක් ලෙස ස්වභාවික ගල්ලෙන් ආශ්‍රයෙන් ඉදි කරන ලද වෙහෙර විහාර දැක්වීමට පුළුවන. එවැනි ලෙන් විහාර ආශ්‍රිතව රූකම් කලා නිර්මාණ රූපයන් ද දක්නට ලැබේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලවතුර ග්‍රාමයේ පිහිටි ගණේගොඩ පුරාණ ලෙන් විහාරය ආශ්‍රිතව දක්නට ලැබෙන අප්‍රකට රූකම් සම්බන්ධ විමසුමක් සිදු කිරීමට ය.


## ක්‍රමවේදය

මෙම අධ්‍යනය සිදු කිරීමේ දී ප්‍රධාන වශයෙන් ක්‍රමවේද දෙකක් භාවිත කරන්නට සිදු විය. එය සාර්ථක ගවේෂණයකට විශේෂ ලෙස උපකාරී විය. එනම්, ක්ෂේත්‍ර නො වන ගවේෂණය, ක්ෂේත්‍ර ගවේෂණය වේ. එහි දී කලින් කර තිබෙන අධ්‍යනයන් කෙරෙහි අවධානය යොමු කිරීම හා ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රමවේදයේ දී අපේක්ෂාව විය. දෙවැන්න ඒ අතර ක්ෂේත්‍රයට ගොස් ප්‍රායෝගික අධ්‍යනයන් තුළින් ගවේෂණය සාර්ථක ලෙස තොරතුරු ලබා ගැනීම හා අවබෝධ කරගැනීම අපේක්ෂාව විය. මෙහිදී ක්ෂේත්‍රය හා ක්ෂේත්‍රය අවට පරිසරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය. එහි දී අලවතුර පිරිවෙණේ නායක ස්වාමීන් වහන්සේගේ සහ ප්‍රදේශයේ වැඩිහිටි අයගේ අදහස් විමසීමක්ද සිදු කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡා

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය කෑගල්ල මාර්ගයේ (ඒ21) අලවතුර ගනේගොඩ ග්‍රාමයේ පිහිටා තිබෙන ලෙන් විහාරයක් ලෙස මෙම ගණේගොඩ පුරාණ ලෙන් විහාරය හඳුනාගත හැකි ය. ප්‍රධාන මාර්ගයේ සිට පාළමකින් එතෙර වී මීටර් 700 පමණ කුඩා පාර දිගේ ගිය පසු මෙම විහාරයට පිවිසෙන ප්‍රධාන පියගැට පෙළ හමු වේ. මෙම පියගැට පෙළ තරණය කිරීමෙන් පසුව විශාල ගල් පර්වතය පාමුල ලෙන් විහාර ආකෘතියකින් නිමවා ඇති මෙම අලවතුර ගණේගොඩ ලෙන් විහාරය දැක ගැනීමට හැකියාව තිබේ. මෙහි ඇති

කැටයම් හා ඉදිකිරීම් ලක්ෂණවලට අනුව මෙම විහාරය ගම්පල යුගයට අයත් බව තහවුරු කරගෙන තිබේ. මෙහි වන වාස්තු විද්‍යා ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන කල එකල ඉදි කිරීම් තාක්ෂණයේ බොහෝ තොරතුරු සාධක යොදා ගනිමින් මනා කලාත්මක ලෙස ඉදිකර තිබෙන බවට සාධක වේ. විශාල පර්වතය පාමුල වන ගල්ලෙන ඉදිරියේ ඉදිකරන ලද විහාර ගෙය ද වාස්තු විද්‍යාත්මකව ඉදිකර තිබේ. විහාරයේ පාදම කොටසේ නර්තන කලාවට සම්බන්ධ රූකම් රැසක් ද දැක ගැනීමට හැකි අතර සියල්ල ම පාහේ කාන්තා රූප වේ.



නර්තන ඉරියව් සහිත කාන්තා රූ කැටයම්

විහාරගෙය තුළ කුළුණු ශෛලමය ස්ථම්භ වන අතර සිවිලිම නිර්මාණය කර තිබෙන්නේ විශාල ශෛලමය ශිලා ස්ථම්බ යොදා ගෙන ය. මෙහි වන ස්ථම්භ අතර දැනට ශේෂව පවතින ස්ථම්භ දෙකක මධ්‍යයේ ඉතාමත් අලංකාර ලෙස සිංහ මුහුණ කැටයම් කර තිබෙන අතර සිංහ මුහුණ ඉතා සියුම් ලෙස නිර්මාණය කර තිබේ. තව ද එක් කණුවක මකර තොරණ සහිතව බුදු රුවක් නෙලා ඇති අතර තවත් මෙවැනි විවිධ කැටයම් සහිත ශිලා ස්ථම්භ කිහිපයක් විහාරය තුළ තබා තිබේ. මෙම විහාරයේ සුවිශේෂී කැටයම් සහිත ස්ථානයක් ලෙස කොරවක්ගල හඳුනාගත හැකි ය. සිංහ කඳකට මකර මුහුණක්



කැටයම් සහිත කොරවක් ගල

යොදා ගනිමින් ඉතාමත් අලංකාර හා සියුම් ලෙස ඉදිකර ඇති මෙම කොරවක්ගල, එහි විකාශන ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් හිමි කරගන්නා බවට සාධක වේ. එමෙන්ම ශේෂ වී ඇති එක් ශිලා ස්ථම්භ කොටසක බෝධිසත්ත්ව රුවක්ද දැක ගැනීමට හැකියාව තිබේ. විහාරය තුළ ඇති වෙනස් ම හැඩයකට ඉදිකර ඇති කැටයම් සහිත මල් ආසනයද ඉතා වැදගත් කලාත්මක ස්මාරකයක් ලෙස පෙන්වාදිය හැකි ය. මෙවැනි තවත් ආසන දැක ගත හැකි ය. විහාරය තුළ ඇති සිතුවම් හා පිළිම වහන්සේලා ද ඉතා පැරණි විහාරයේ ඓතිහාසිකත්ව ය මනාව විදහා දක්වන සාධක බවට ද තොරතුරු වේ. මෙලෙස මෙම ගණේගොඩ විහාරයේ සියළු ශෛලමය රූකම් කෙරෙහි අවධානය යොමු කිරීමේ දී පියගැට පෙළ හා එහි ඇතැම් ස්ථානවල පවතින රූකම්, කොරවක්ගල කැටයම්, විහාර පාදමේ ඇති කැටයම් (නළඟන රූකම්, සත්ත්ව කැටයම්, පලා පෙති, ලියවැල්, බොරදම්), ශිලා ස්ථම්භ වලට සව්වන ස්ථානීය කැටයම්, බෝසත් රූ ආදී කැටයම් කෙරෙහි විශාල වශයෙන් අවධානය යොමු කර බැලීම තුළින් විහාරයේ ඓතිහාසිකත්වය මනාව ගම්‍ය වේ. මෙම තොරතුරු මගින් විහාරයේ ඓතිහාසික තොරතුරු රැසක් මෙන් ම මෙම කැටයම් මගින් දකුණු ඉන්දීය අභාෂයක් පෙන්නුම් කරන බව පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීමේ දී ගම්පොළ යුගය වන විට දකුණු ඉන්දීය ආභාෂය කලාව කෙරෙහිද නො අඩුව ලැබී තිබූ බවට සාධක වේ. මෙහි දී ද මෙම ගණේගොඩ විහාරයේ ඇති නර්තන ඉරියව් සහිත කැටයම් මගින් ඒ බව මනාව අනාවරණය වේ. මෙහි වන නළඟන රූ හා වාදන රූ සහිත කැටයම් ඊට සාධක වේ. මෙහි වන සුවශේෂී ම කරුණක් වන්නේ මෙම කැටයම් අතර වාදනයේ නිරතවන වාදන ශිල්පිනියන් නිරූපනය කර තිබීම වේ. එමගින් එවකට නර්තන ශිල්පිනියන්ගේ මෙන්ම වාදන ශිල්පිනියන් අති දක්ෂ කලාකාරිනියන් වූ බව පසක් කරවයි. එමෙන් ම මෙහි වන කොරවක්ගල කැටයම කෙරෙහි අවධානය යොමු කිරීමේ දී විශේෂ ලෙසම සිංහ කඳ සහිත සිංහයා විහාරය දෙසට කඳ හරවා සිටින අතර උගේ හිස මකර හිසක් වන අතර මුවින් නිකුත් වන ගිනිදැල් කොරවක්ගලේ අවසාන නිර්මාණය දක්වා දිවේ. මෙම සිංහයා ශක්තිය ගෙන වැර ගෙන සිටින බව ඇඹරුණු ස්වරූපයෙන් දක්වා ඇති වලිගයෙන් කරුණු සනාථ වේ.එමෙන්ම පාදවල ගාත්‍රා ප්‍රදේශද මේ සඳහා උදාහරණ වේ. එමෙන් ම ඉදිරිපස එක් පාදයක් ඔසවාගෙන සිටින ආකාරය ද විශේෂ ලක්ෂණයක් ලෙස පෙන්වාදිය හැක.

මෙහි ඇති සත්ත්ව රූ කෙරෙහි අවධානය යොමු කිරීමේ දී බොහෝ දුරට සිංහයා, මකරා හා එක් ස්ථානයක හංසයා පමණක් යොදාගෙන තිබෙන අතර එම සිංහයන් හා මකරුන් විවිධ ස්වරූපයෙන් නිමවා තිබේ. එමගින් ස්ථානීය වශයෙන් ස්ථානයෙන් ස්ථානයට අලංකාරයක් හා වටිනාකමක් ගෙන දීමට ශිල්පියා උත්සාහ කර තිබෙන බව පැහැදිලි වේ. සැම විටම පෙළට දක්වා තිබෙන සිංහ රූ චංචල ස්වරූපයෙන් සිටින ආකාරයක් දක්වා තිබේ. එමෙන් ම කළබලකාරී ස්වරූපයක් ද එමගින් දිස්වන බව පැහැදිලි වේ. කොරවක්ගල සිංහ රුව හා මකර හිස සහිත කොටස ද එලෙස වේ. ශිල්පියා එමගින් යමක් ප්‍රකාශ කිරීමට උත්සහ කර තිබෙන බව පැහැදිලි වේ. අනෙකුත් කැටයම් අතර ලියවැල් පලාපෙති ආදිය මෙන් ම බොරදම් කැටයම් මනා ලෙස යොදා ගෙන තිබෙන බවට සාධක පැහැදිලි ලෙස දැකගත හැකි වේ. එමෙන් ම උස් වූ ශෛලමය පාදමක් මත විහාරය ඉදිකර තිබේ. විශේෂයෙන් ම මානව හා සත්ත්ව රූකම් වලට හානියක් නො වන අයුරින් පලාපෙති හා ලියවැල් බොරදම් මෝස්තර යොදා ගෙන තිබෙන ආකාරය ඉතාමත් කලාත්මක ය.

විහාරයේ උළුවස්ස ගලින් නිමවා තිබෙන අතර ලියවැල් මෝස්තර යොදා ගනිමින් ඉතා අලංකාර ලෙස නිමවා තිබේ. එමගින් විහාරයට ශක්තිමත් හා අලංකාර බවක් එක් කර තිබේ. මෙලෙස මෙම විහාරයේ කැටයම් කෙරෙහි අවධානය යොමු කරන කල ගඩලාදෙණි විහාරයේ ඉදිකිරීම් ලක්ෂණවලට සමාන ලක්ෂණ මෙමගින් නිරූපනය වන බව සනාථ වන අවස්ථා ද වේ. කෙසේ වෙතත් ගම්පොළ යුගයට අයත් සීතාවක රාජධානියේ පිහිටා තිබෙන මෙම විහාරය කැටයම් අතින් ඉතා ඉහළ අගයක් ගන්නා ඓතිහාසික ස්ථානයක් ලෙස අනාවරණය කර ගැනීම පුරාවිද්‍යාත්මක ව බොහෝ සෙයින් වටිනා බව පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


විතානාච්චි, සී. ආර්. (2016) ***පෞරාණික ස්ථාන සහ ස්මාරක (කෑගල්ල දිස්ත්‍රික්කය).*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.